# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2361/04 – 2023 දෙසැම්බර් මස 04 වැනි සඳුදා – 2023.12.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2022/69.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2023.10.30 වැනි දින අංක 2356/07 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.10.18 වැනි දින දරන නියෝගයෙන්,

ආර්.පී.අයි.එච්. රාජපක්ෂ මිය, අංක 289/8, වැව පාර, මාලඹේ.

සහ

ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය, එම්.ඩී.එච්. ජයවර්ධන මාවත, අතුරුගිරිය.

අතර පවත්නා 2023.08.18 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් කාංචන සිල්වා මහතා වෙත යොමු කරන ලදී.

බේරුම්කරු කාංචන සිල්වා මහතා එම ආරාවුලෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2023.10.18 වැනි දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

මනූෂ නානායක්කාර,
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 නොවැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

EOG 12 – 0036/1

මගේ අංකය: IR/COM/01/2022/69.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

ආර්.පී.අයි.එච්. රාජපක්ෂ මිය, අංක 289/8, වැව පාර, මාලබේ.

සහ

ජාතික වැව්ලි කළමනාකාරණ ආයතනය, එම්.ඩී.එච්. ජයවර්ධන මාවත, අතුරුගිරිය.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මාතලේ, මැක්ඩොවල් බලකොටුව මාවත, පළමු පටුමඟ, 34/64, ඒ.බී. හේරත් මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 නොවැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2022/69.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ආර්.පී.අයි.එච්. රාජපක්ෂ මිය, අංක 289/8, වැව පාර, මාලබේ.

සහ

ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය, එම්.ඩී.එච්. ජයවර්ධන මාවත, අතුරුගිරිය.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''ජාතික වැව්ලි කළමනාකරණ ආයතනයේ සහකාර අධ්‍යක්ෂ (පාලන) ලෙස සේවය කළ ආර්.පී.අයි.එච්. රාජපක්ෂ මහත්මිය 2019.03.25 දින සිට බලපැවැත්වෙන පරිදි රැකියාවෙන් ඉවත් කිරීමේ දී ආයතනය අනුගමනය කර ඇති ක්‍රියාපිළිවෙල මගින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඇයට හිමිවිය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 නොවැම්බර් මස 23 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 12 – 0036/2

මගේ අංකය: IR/COM/02/2023/46.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

පී.එච්.කාංචනා ප්‍රියදර්ශනී මිය, අංක 2/23, මැද පාර, උතුරු තල්පිටිය, වාද්දුව.

සහ

සී.එම්.එල්. - එම්.ටී.ඩී. කන්ස්ට්‍රක්ෂන් ලිමිටඩ්, නො. 18, ශාන්ත මයිකල් පාර, කොළඹ 03.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, පිළියන්දල, බුද්ධාලෝක පාර, 40, කේ.ඒ. තිලකරත්න මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 නොවැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2023/46.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

පී.එච්. කාංචනා ප්‍රියදර්ශනී මිය, අංක 2/23, මැද පාර, උතුරු තල්පිටිය, වාද්දුව.

සහ

සී.එම්.එල්. - එම්.ටී.ඩී. කන්ස්ට්‍රක්ෂන් ලිමිටඩ්, නො. 18, ශාන්ත මයිකල් පාර, කොළඹ 03.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''සී එම් එල් - එම් ටී ඩී කනස්ට්‍රක්ෂන් ලිමිටඩ් හි සේවය කරන ජී.එච්. කාංචනා ප්‍රියදර්ශනී මහත්මිය හට 2020 නොවැම්බර්,දෙසැම්බර්, 2021 මාර්තු, අප්‍රේල් මාස වලට අදාළ ක්ෂේත්‍ර දිරි දීමනාව හිමි ද හිමිනම් එය නොලැබීමෙන් අසාධාරණයක් සිදුවී තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ලැබිය යුතු සහනයන් කවරේ ද යන්නත් පිළිබඳ ව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 නොවැම්බර් මස 23 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 12 – 0037

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.